**හිතවත් බැංකු ගණුදෙනුකරුවනි,**

ශ්‍රී ලංකා මහබැංකුව විසින් නිකුත් කරන ලද පාරිභෝගික ප්‍රඥප්තිය යටතේ දැක්වෙන නියමයකට අනුව, අපගේ බැංකුව විසින් මූලික කරුණු අන්තර්ගත ලේඛන (Key Fact Documents)මාලාවක් සකස් කර ඇති අතර, ඔබට අවශ්‍ය වන සහ ඔබට සුදුසු වන පරිදි, අපගේ බැංකුව විසින් සපයන බැංකු ගිණුම් පහසුකම්/සේවාවන් තෝරාගැනීම පිණිස ඔබට සහාය වීමට එකී ලේඛන මාලාවෙන් අපේක්ෂා කරනු ලැබේ.

පෞද්ගලික බැංකු කටයුතුවල නිරත සේවාදායකයන් සඳහා නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී හි තිබෙන නියාමන ගිණුම් (Regulated Accounts) පිළිබඳව පුළුල් සංක්ෂිප්ත විස්තරයක් මෙම මූලික කරුණු අන්තර්ගත ලේඛනවලින්(**KFDs**)ඔබ වෙත සපයනු ලැබේ.(ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුව විසින් විදේශ විනිමය පනත යටතේ නිකුත් කරන ලද වර්තමාන උපදෙස්වලට යටත්ව,)

කෙසේ වූව ද, මෙම මූලික කරුණු අන්තර්ගත ලේඛනවල මතු සඳහන් කාරණාවන් හුදෙක්නෛතික සහ නියාමන වෙනස්කම්වලට සහ අපගේ බැංකුවේ අභ්‍යන්තර ප්‍රතිපත්ති සහ කාර්ය පටිපාටිවල සිදුකරන වෙනස්කම්වලට අනුකූලව ප්‍රතිශෝධනය වීමක් අවශ්‍ය විය හැකි බව කරුණාවෙන් සලකන්න.

මේ පිළිබඳ වැඩිමනත් තොරතුරු ලබාගැනීමට ඔබ අපේක්ෂා කරන්නේ නම්, කරුණාකරwww.nationstrust.comවෙබ් අඩවිය වෙත පිවිසීමට හෝ 0114 711 411 දරන දුරකථන අංකයෙන් පැය 24 පුරා ක්‍රියාත්මක ඇමතුම් මධ්‍යස්ථානය ඔස්සේ අප බැංකුව ඇමතීමට කාරුණික වන්න.

පහත සඳහන් ඔබගේ යම් කවරම වූ ගිණුමක් සම්බන්ධයෙන් යම් කවරම වූ පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට ඔබට ඇත්නම්, එම පැමිණිල්ල පිළිබඳ දැන්වීම අඩංගු ලුහුඩු ලිඛිත ප්‍රකාශයක්,**කොළඹ 02,යූනියන් පෙදෙස, අංක 242,නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී හී පැමිණිලි විසඳීමේ නිලධාරි** වෙත යොමු කිරීමෙන් හෝ **අංක**[+94(0)114 711 411]දරන දුරකථනයඔස්සේ අප අමතා දැනුම්දීමෙන් හෝ අප බැංකුවේ customerservice@nationstrust.com විද්‍යුත් තැපෑලට යොමු කිරීමෙන් හෝ ඉදිරිපත් කළ හැකි වන අතර, අප බැංකුව විසින් ඔබගේ පැමිණිල්ල පිළිබඳව ඔබ වෙත ක්ෂණික විසඳුම් ලබාදීමට කටයුතු කරනු ලැබේ.



නේශන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී PQ118,242යූනියන් පෙදෙස,කොළඹ2.

| ගිණුමේ විස්තරය | බැංකු ගණුදෙනුකරුට අත්වන වාසි | බැංකු ව විසින් පනවන ගාස්තු වර්ග සහ වෙනත් අයකිරීම් | ගිණුම විවෘත කිරීමට අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය | ප්‍රධාන නියමයන් සහ කොන්දේසි |
|---|---|---|---|---|
| **පෞද්ගලික විදේශ මුදල් ගිණුම් (PFCs)**<br>පහත සඳහන් සණවල ගිණුම් පෞද්ගලික විදේශ මුදල් ගිණුම් (PFCs) වශයෙන් නැවත නම්කර ඇත.<br>➢ අනේවාසික විදේශ මුදල් ගිණුම් (NRFCs)<br>➢ නේවාසික විදේශ මුදල් ගිණුම් (RFCs)<br>➢ නේවාසික පුරවැසි නොවන විදේශ මුදල් ගිණුම් (RNNFCs)<br>➢ අනේවාසික පුරවැසි නොවන විදේශ මුදල් ගිණුම් (NRNNFCs) | • බද්ධ ගිණුම් විවෘත කිරීමේ හැකියාව. [අනේවාසික පුරවැසි නොවන විදේශ මුදල් ගිණුම් හැර,]<br>• ජංගම ගිණුම් /ඉතිරි කිරීමේ ගිණුම් හෝ ස්ථිර තැන්පතු ආකාරයෙන් ගිණුම පවත්වාගෙන යාමේ හැකියාව.<br>• බාලවයස්කරුවන් සඳහා ගිණුම් විවෘත කිරීමේ හැකියාව.<br>• පදිංචියේ ස්වභාවය තාවකාලික හෝ ස්ථිර වුව ද නැත ද, ගිණුමක් විවෘත කිරීමේ හැකියාව. (NRNNFCs)<br>• ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නම්කරන ඕනෑම විදේශ මුදලකින් ගිණුම පවත්වාගෙන යාමේ හැකියාව. (NRNNFCs)<br>• කෙටි පිණිවිඩ (SMS) සංඥා සහිතව ඩිජිටල් බැංකුකරණය.(මොබයිල්/ඔන්ලයින්)<br>• විවිධ රටවල සිටින තැනැත්තන් අතර සිදුවන ගණුදෙනුවල දී, විදේශ විනිමය අනුපාතයේ උච්චාවචනයන් වළක්වා ගැනීමේ හැකියාව.<br>• ඉතිරි කිරීමේ ගිණුමේ ශේෂය මත සහ ස්ථාවර තැන්පතු මත පොළිය ලබාගැනීමේ හැකියාව. | • ගිණුම් වසාදැමීමේ ගාස්තුව<br>• වෙනත් බැංකු හුවමාරු ගාස්තුව<br>• ඩෙබිට් කාඩ්පත් ගාස්තු<br>• අවම ශේෂයක් පවත්වා නොගැනීමේ ගාස්තුව<br>• බැංකු ගාස්තු ලේඛන අනුව අදාල වන යම් වෙනත් ඕනෑම ගාස්තුවක් | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද උපදෙස් සම්බන්ධයෙන්අප බැංකුව විසින් නියම කරන ලේඛනමය ඔප්පුකිරීම් සහිතව, අප බැංකුවේ ස්වයංක්‍රීය ඩිජිටල් ක්‍රියාදාමය වෙත පිවිසීම. | • **සුදුසුකම් ලබන බැංකු ගණුදෙනුකරුවන්:**<br>➢ බාලවයස්කරුවන් ඇතුළුව විදේශ රටවල පදිංචිව සිටින, ශ්‍රී ලාංකික පුරවැසියන්/ ශ්‍රී ලාංකික සම්භවයක් සහිත තැනැත්තන්.<br>➢ බාලවයස්කරුවන් ඇතුළුව ශ්‍රී ලාංකාවේ පදිංචිකරුවන්.<br>➢ බාලවයස්කරුවන් ඇතුළුව නේවාසික වීසාවක් මත තාවකාලිකව හෝ ස්ථිරව ශ්‍රී ලාංකාවේ සිටින පුරවැසියන් නොවන තැනැත්තන්.<br>➢ ශ්‍රී ලාංකාවට තාවකාලිකව පැමිණි හෝ ශ්‍රී ලාංකාවට පැමිණීමට අපේක්ෂාවෙන් සිටින, පුරවැසියන් නොවන තැනැත්තන්.<br><br>• සියළුම ගිණුම් හර කිරීම් සහ බැර කිරී , 2021 අංක 04 දරන ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ නියෝග සහ ඉක්බිතව ඊට සිදුකරන සංශෝධනවලට යටත්ව, සිදුවනු ලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| අනේවාසික රුපියල් ගිණුම් [ NRRA] | • ජංගම ගිණුම්(බැංකු අයිරා පහසුකම් රහිත)/ඉතිරි කිරීමේ ගිණුම් හෝ ස්ථිර තැන්පතු ආකාරයෙන් ගිණුම පවත්වාගෙන යාමේ හැකියාව.<br>• තනි ගිණුම් වශයෙන් ගිණුමවිවෘත කිරීමේ හැකියාව. [බද්ධ ගිණුමක් අනෙක් විගාමිකයා සමඟ පමණක් විවෘත කිරීමට අවසරය ලබාදීම.]<br>• කෙටි පණිවුඩ සංඥා(SMS) සේවාව සහිතව සහ ශ්‍රී ලංකා මහබැංකුවේ උපදෙස් අනුව, කොන්දේසිවලට යටත්ව ඩිජිටල් බැංකුකරණ ප්‍රවේශය (මොබයිල්/ඔන්ලයින්)<br>• ඉතිරි කිරීමේ ගිණුමේ ශේෂය මත සහ ස්ථාවර තැන්පතු මත පොළිය ලබා ගැනීමේ හැකියාව. | • ගිණුම වසා දැමීමේ ගාස්තුව<br>• අනෙකුත් බැංකු හුවමාරු ගාස්තුව<br>• ඩෙබිට් කාඩ්පත් ගාස්තුව<br>• අවම ශේෂයක් පවත්වා නොගැනීමේ ගාස්තුව<br>• බැංකු ගාස්තු ලේඛන අනුව අදාල වන යම් වෙනත් ගාස්තුවක් | නිසි පරිදි සම්පූර්ණ කරන ලද, ගිණුමක් විවෘත කිරීමේ ආදර්ශ අයදුම්පත්‍රය, විගාමිකයෙක්ගේ තත්ත්වය සනාථ කරන ලියවිලිසමඟ, බැංකුවේ ඕනෑම ශාඛාවක් වෙත භාරදිය යුතුය. අදාල වන පරිදි, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද උපදෙස්වලට අනුගතව, බැංකුව විසින් නියම කරන පරිදි, ස්ථිර පදිංචි වීසාව, ද්විත්ව පුරවැසිභාවය, විදේශයේ ලිපිනය වැනි සනාථ කිරීමේ ලියවිලි සහ වෙනත් අවශ්‍ය සනාථ කිරීමේ ලියවිලි ඉදිරිපත් කළ හැකිය. | **සුදුසුකම් ලබන තැනැත්තන්**<br>• ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත සිටින විගාමිකපදිංචිකරුවෙකු<br>• ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටුවා තිබෙන/සංස්ථාගත කර තිබෙන ව්‍යාපාර ආයතනයක්/සමාගමක්<br><br>• සියලුම ගිණුම් හර කිරීම සහ බැර කිරීම, 2021 අංක 18 දරන ශ්‍රී ලංකා මහබැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ නියෝග වලට යටත්වනු ලැබේ. |
| ව්‍යාපාර විදේශ මුදල් ගිණුම්(BFCs) | • ජංගම ගිණුම්/ඉතිරි කිරීමේ ගිණුම් හෝ ස්ථිර තැන්පතු ආකාරයෙන් ගිණුම පවත්වාගෙන යාමේ හැකියාව.<br>• ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නම්කරන ලද ඕනෑම විදේශ මුදලකින් ගිණුම පවත්වාගෙන යාමේ හැකියාව.<br>• ඉතිරි කිරීමේ ගිණුමේ ශේෂය මත සහ ස්ථාවර තැන්පතු මත පොළිය ලබාගැනීමේ හැකියාව. | • ගිණුම වසා දැමීමේ ගාස්තුව<br>• අනෙකුත් බැංකු හුවමාරු ගාස්තුව<br>• අවම ශේෂයක් පවත්වා නොගැනීමේ ගාස්තුව<br>• බැංකු ගාස්තු ලේඛන අනුව අදාල වන යම් වෙනත් ගාස්තුවක් | නිසි පරිදි සම්පූර්ණ කරන ලද, ව්‍යාපාර ගිණුමක් විවෘත කිරීමේ ආදර්ශ අයදුම් පත්‍රය, විදේශ ආදායම සනාථ කරන ලියවිලි සහ අවශ්‍ය අනෙකුත් ලියවිලි සමඟ බැංකුවේ ඕනෑම ශාඛාවක් වෙත භාරදිය හැකිය.<br><br>අදාල වන පරිදි, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද උපදෙස්වලට අනුගතව, බැංකුව විසින් නියම කරන පරිදි, අනෙකුත් සනාථ කිරීමේ | **සුදුසුකම් ලබන තැනැත්තන්**<br>• ශ්‍රී ලංකාව තුළ පදිංචි තනි පුද්ගලයෙකු<br>• ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කරන ලද තනි පුද්ගල ව්‍යාපාරයක්/හවුල් ව්‍යාපාරයක්<br>• ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරන ලද සමාගමක්<br>• 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද විදේශීය සමාගමක් |

| | | | | |
|---|---|---|---|---|
| | • නේෂන්ස්ඝෘජුව්‍යාපාර(NDE)පහසුකම | | ලියවිලි ඉදිරිපත් කළ යුතුය. | • අදාල රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය සහිතව රජයේ යම් ආයතනයක්<br>• සියලුම ගිණුම් හර කිරීම් සහ බැර කිරීම්, 2021 අංක 5 දරන ශ්‍රී ලංකා මහබැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ නියෝගවලට යටත්වනු ලැබේ. |
| **අභ්‍යන්තර ආයෝජන ගිණුම(IIA)**<br>දැනට පවත්නා සුරැකුම්ආයෝජන ගිණුම (SIA)/විශේෂ විදේශ ආයෝජන තැන්පතු ගිණුම (SFIDA)අභ්‍යන්තර ආයෝජන ගිණුම(IIA)වශයෙන් නැවත නම්කිරීම. | • ජංගම ගිණුම්/ඉතිරි කිරීමේ ගිණුම් හෝ ස්ථිර තැන්පතු ආකාරයෙන් ගිණුම පවත්වාගෙන යාමේ හැකියාව.<br>• ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නම්කරන ලද යම් ඕනෑම විදේශ මුදලකින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් ගිණුම පවත්වාගෙන යාමේ හැකියාව.<br>• බද්ධ ගිණුමක් විවෘත කිරීමේ හැකියාව [අභ්‍යන්තර ආයෝජන ගිණුමේ(IIA)උපදෙස් වලට යටත්ව]<br>• කෙටි පණිවුඩ සංඥා (SMS) සේවාව සහිතව, කොන්දේසිවලට යටත්ව ඩිජිටල් බැංකුකරණ ප්‍රවේශය (මොබයිල්/ඔන්ලයින්)<br>• ඉතිරි කිරීමේ ගිණුමේ ශේෂය මත, ව්‍යාපාර ගිණුමසහ ස්ථාවර තැන්පතු මත පොළිය ලබාගැනීමේ හැකියාව. | • ගිණුම වසා දැමීමේ ගාස්තුව<br>• අනෙකුත් බැංකු හුවමාරු ගාස්තුව<br>• ඩෙබිට් කාඩ්පත් ගාස්තුව<br>• බැංකු ගාස්තු ලේඛන අනුව අදාල වන යම් වෙනත් ගාස්තුවක් | නිසි පරිදි සම්පූර්ණ කරන ලද, ගිණුමක් විවෘත කිරීමේ ආදර්ශ අයදුම් පත්‍රය, අනන්‍යතාව සනාථ කිරීමේ සහ ලිපිනය සත්‍ය බවට තහවුරු කිරීමේ ලියවිලි සමඟ බැංකුවේ ඕනෑම ශාඛාවක් වෙත භාරදිය හැකිය.<br><br>අදාල වන පරිදි, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද උපදෙස්වලට අනුගතව, බැංකුව විසින් නියම කරන පරිදි, වෙනත් අවශ්‍ය සනාථ කිරීමේ ලියවිලි ඉදිරිපත් කළ යුතුය. | **සුදුසුකම් ලබන තැනැත්තන්**<br>• ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත පදිංචි, පුරවැසියෙකු නොවන තැනැත්තෙක්<br>• ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත පදිංචි, ශ්‍රී ලාංකික ද්විත්ව පුරවැසිකයෙක්<br>• ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත පදිංචි,වෙනත් රටක ස්ථිර පදිංචිය හෝ පුරවැසිභාවය සහිත ශ්‍රී ලාංකිකයෙක්<br>• ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචි, විදේශ රටක සේවයේ නියුක්ත ශ්‍රී ලාංකික පුරවැසියෙක්<br>• ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද/ලියාපදිංචි කරන ලද සමාගමක්/හවුල් ව්‍යාපාරයක්<br>• ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටුවන ලද රටේ/කලාපයේ/අන්‍යෝන්‍ය වශයෙන් වන අරමුදල්/ඒකක භාරයන් සහ විදේශ රටක ආයෝජකයන්<br><br>• සියලුම හර කිරීමේ සහ බැර කිරීමේ ගණුදෙනු, 2021 අංක 15 දරන ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ නියෝග වලට යටත්වනු ලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | | | • අභ්‍යන්තර ආයෝජන ගිණුම්(IIA)ලිපිගොනුවක්, ගිණුම පවත්වාගෙන යන බැංකු ශාඛාවේ විවෘත කළ යුතු වන අතර, සියලුම ආයෝජන ආශ්‍රිත ලේඛන, අධීක්ෂණ කිරීමේ කාර්ය සඳහා තබාගත යුතුය. |
| **බාහිර ආයෝජන ගිණුම (OIA)** | • ජංගම ගිණුම්/ඉතිරි කිරීමේ ගිණුම් ආකාරයෙන් ගිණුම පවත්වාගෙන යාමේ හැකියාව. ස්ථිර තැන්පතු, ආයෝජන ප්‍රතිලාභ සහිතව විවෘත කළ හැකිය.<br>• නම් කරන ලද ඕනෑම විදේශ ව්‍යවහාර මුදලකින් ගිණුම පවත්වාගෙන යාමේ හැකියාව.<br>• ඉතිරි කිරීමේ ගිණුමේ ශේෂය මත සහ ස්ථාවර තැන්පතු මත පොළිය ලබාගැනීමේ හැකියාව. | බැංකු ගාස්තු ලේඛන අනුව අදාල වන ගාස්තු | නිසි පරිදි සම්පූර්ණ කරන ලද, ගිණුමක් විවෘත කිරීමේ ආදර්ශ අයදුම් පත්‍රය, බාහිරආයෝජන ගිණුමේ උපදෙස්වල නියම කරන පරිදි අතිරේක ලේඛන සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නිෂ්කාසනය සමඟබැංකුවේ ඕනෑම ශාඛාවක් වෙත භාරදිය හැකිය. | **සුදුසුකම් ලබන තැනැත්තන්**<br>• ඇපයෙන් සීමිත සමාගම් හැර, සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරන ලද සමාගම්<br>• ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කරන ලද හවුල් ව්‍යාපාරයක්<br>• ශ්‍රී ලංකාව තුළ පදිංචි තනි පුද්ගලයෙක් හෝ එවැනි තනි පුද්ගලයෙකු විසින් ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කරන ලද තනි හිමිකාර ව්‍යාපාරයක්.<br>• සියලුම හර කිරීමේ සහ බැර කිරීමේ ගණුදෙනු, 2021 අංක 14 දරන ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ නියෝග වලට යටත්වනු ලැබේ. |